## බෞද්ධ ආගමික ප්‍රබෝධය, අමද්‍යප ව්‍යාපාරය සහ ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා

**සාලිය හෙට්ටිආරච්චි**
ව්‍යාපෘති සම්බන්ධීකරණ ලේකම්
ශ්‍රීමත් අනගාරික ධර්මපාල ප්‍රජා නායකත්ව පුහුණු සහතික පත්‍ර පාඨමාලාව
*ransada1@gmail.com*

විසිවන සියවසට ශ්‍රී ලංකාව පිවිසෙන්නේ ඉංග්‍රීසී අධිරාජ්‍යයට නිදහස ලියා දී සියවසක් සපිරීමත් සමඟ ය. 1848 දී පුරන් අප්පු මෙහෙය වූ නිදහස් අරගලයෙන් පසු ඇතිවූ දැඩි මර්දනකාරී ඉංග්‍රීසි පාලන කාලය තුළ, නිදහස් චින්තන, බෞද්ධ ආගමික ප්‍රබෝධයන්, නිදහස් අරගලයන් වැඩෙන්නට තිබූ ඉඩකඩ ඉංග්‍රීසී පාලකයින් බෙහෙවින් අසුරා තිබුණි. ඉංග්‍රීසී අධිරාජ්‍යයෙන් යැපෙන්නට උවමනා මානසිකත්වය සහ පරිසරය මෙරට ජනතාව තුළ පැළපදියම් කර ඉංග්‍රීසීන්ට උවමනා පරිදි සිතන්නට ජන සමාජයක් බිහි වෙමින් පැවැතිණි. මෙරටත් ජාතියත් නිදහස් අරගලය කරා මෙහෙය වූ, ජාතීන්ගේ පිනට උපන් ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා, රටේ ආර්ථික දේශපාලනික ආගමික නිදහස සමග වැළලී යමින් තිබූ බෞද්ධ ආගමික ප්‍රබෝධය යළි ගොඩනැගීමට වෙර ගත්, පුද්ගලයෙකු ජීවත් විය යුතු, හැසිරිය යුතු, කතාබහ කළ යුතු අයුරු පවා රටට කියා දුන්, ස්වජාතික අභිමානය නැවත පුබුදුවාලූ වීරයාණෝ ය.

මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ පංච මහා වාදයන්ගේ වැදගත් වූත්, ඓතිහාසිකවූත් මෙරට බෞද්ධ ප්‍රබෝධයේ හැරවුම් ලක්ෂයවූත් පානදුරාවාදය 1873 දී නව හැවිරිදි දරුවෙකු ලෙස දකින අනගාරික ධර්මපාලතුමා, ගුණානන්ද හිමියන් ගොඩ නගන්නට වෙර දැරූ සාරධර්ම පිරී ජාති හිතෛෂී ගිහි සමාජයේ ජන නායකයා බවට පත් විය.

එතුමා රටේ ජාතික ආගමික ප්‍රබෝධය නංවාළමින් දැනුමන් අවබෝධයෙන් හීනව සිටි ජාතිය දැනුවත් කරමින් දේශන සිදු කළේ ඉංග්‍රීසීන් කර්මාන්තශාලා අරඹමින් සිටි යුගයේදීය. ඉංග්‍රීසි පාලකයින් ඔවුන්ගේ අරමුණු ගණනාවක් ඉටු කර ගැනීම සඳහා මෙරට තුළ මත් බීම ව්‍යාපාරය ද ආරම්භ කළේ මෙම යුගයේදී ය. ඔවුන්ගේ අරමුණු මෙසේ විය. පළමු අරමුණ වූයේ, මෙරට ධනය ඔවුන්ගේ රටට ගෙන යන මාර්ගයක් ඇති කර ගැනීමයි. ඒ අතරම රජයේ ආදායම වැඩිකර ගැනීමත්, මිනිසුන්ගේ ධනය නිරපරාදේ වියදම් කරවීමත්, මිනිසුන් සහ පවුල් අතර අඩදබර ඇති වීම තුළ කායික මානසික සාමාජීය සෞඛ්‍ය පිරිහීමට ලක් වීමත්, වැඩිපුර නාස්ති කරන්න මුදල් වැඩිපුර ඉපයීමට සිදු වීමත්, ඒ තුළින් පාලකයාට අවශ්‍ය ශ්‍රමය සොයා ගැනීමට කටයුතු සැකසීමත් මෙම අරමුණු අතර විය.

මත් බීමෙන් සහ මත්ද්‍රව්‍ය වලින් මිනිසුන් උන්මන්තකයින් ලෙස හැසිරෙනවා මෙන්ම එය මෙරට මුදල් පිටරටට ගෙන ගිය මහා ව්‍යසනයක් බව ධර්මපාලතුමා දුටුවේය. රටේ මිනිසුන් තව තවත් දුප්පත් වන ආකාරයත් සාමය සදාචාරය පිරිහෙන ආකාරයත් දුටු ධර්මපාලතුමා, ඩී. එස්. සේනානායක, පී. ආර්. සේනානායක, ඩී. ඩී. සේනානායක, ඩී. බී. ජයතිලක, ඩබ්. ඒ. සිල්වා, ආතර් වීදියෙස්, පියදාස සිරිසේන සහ සිය සොයුරා වන එසවන් හේවාවිතාරණ වැනි නායකයින් සමග එක්ව අමද්‍යප ව්‍යාපාරය සැලසුම් කළේය. ධර්මපාලතුමන් නගර ගම් දනව් සිසාරා පුවත් සඟරා පළ කරමින්, අමද්‍යප සමිති පිහිටුවමින්, බීමත්කමේ ආදීනව හා එයින් මිදීමට ගත යුතු ක්‍රියාමාර්ග ගැන ජනතාව දැනුවත් කළේය.

1837 දී නිකුත් කළ පළමු අරක්කු අවසර පත විවිධ ව්‍යාපාරිකයින් අරක්කු ව්‍යාපාරයේ නියුතු කරමින් ජනතාවට මත් බීම පොවන්නට විය. 1912 මැයි 31 සම්මත වූ සුරා බදු ආඥා පනතින් ගම්මාන 1072ක් පුරා රා තැබෑරුම් විවෘත කිරීමට ව්‍යවස්ථා සභාව ගත් තීරණයේ දී, දකුණේ සිංහල නියෝජිත මන්ත්‍රී ක්‍රිස්ටෝපර් ඔබේසේකර ඊට පක්ෂව ඡන්දය ලබා දීමත් පොන්නම්බලම් රාමනාදන් විරුද්ධව ඡන්දය ලබා දීමත් තුළ, සිංහල දේශපාලඥයින් අරක්කු ලයිසන් හිමිකරුවන් වීමේ ඉතිහාසය මැනවින් කියා පායි. අනගාරික ධර්මපාල තුමා ඇරඹි අමද්‍යප ව්‍යාපාරයේ නායකයින්, 1915 දී සිදු වූ මරක්කල බෞද්ධ කෝලාහලය මුවාවෙන් රාජ්‍ය ද්‍රෝහීන් ලෙස හංවඩු ගසා අත්අඩංගුවට ගෙන සිර දඬුවම් ලබා දීම තුළින් අමද්‍යප ව්‍යාපාරය මගින් ඉංග්‍රීසි ආණ්ඩුව දෙදරුම් කා තිබූ බවත්, මත් බීම ලංකාව පුරා පැතිරවීමට ඉංග්‍රීසීන්ට තිබූ උවමනාවත් පැහැදිළි වේ. සිරගත කළ නායකයින් අතර සේනානායක සොයුරන්, වලිසිංහ හරිස්චන්ද්‍ර, ඩී. බී. ජයතිලක, ආතර් සිල්වා, ආතර් වීදියෙස්, සී. බටුවන්තුඩාව, රිචඩ් සල්ගාදු, පී. ඊ. ගුණසිංහ වැනි ජන නායකයින් විය.

අමද්‍යප නායකයින් මෙසේ සිරගත වීමෙන් විවිධ ව්‍යාපාර සංවිධාන තුළ සිටි සියලු දෙනා එක් වීම මහා ශක්තියක් බවට පත්විය. ධර්මපාල තුමාගේ ආගමික ප්‍රබෝධය මත ගොඩ නැගුණු බෞද්ධ පුනරුදය අමද්‍යප ව්‍යාපාරය නිදහස් අරගලයේ මුල් අවස්ථාව බවට පත් විය. මෙරට ජනතාව මත් බීම පිළිකුල් කරන බවට රොබට් නොක්ස් විසින් එදා හෙළදිව නම් කෘතියේ දී සාක්ෂි දරයි. "සිංහලයා මත්පැන් නොබොයි, ගෙරි මස් පිළිකුල් කරයි" යනුවෙන් නොක්ස් සඳහන් කරයි.

නමුත් වර්තමාන සංඛ්‍යා ලේඛන වලට අනුව ඒක පුද්ගල වාර්ෂික මත් බීම පරිභෝජනය ලීටර් 10 කි. දළ වශයෙන් එක් අයෙකු මත් බීම ලීටරයක් පානය කරයි. ලෝකයේ විශාලම ඒක පුද්ගල මත් බීම පරිභෝජනය කරන රට ද මෙයයි. පසුගිය වසරේ පමණක් සෘජු සුරා බද්ධ බිලියන 100 කි. සිගරට් බද්ධ බිලියන 70 කි.

එදා අනගාරික ධර්මපාලතුමා මෙම තත්වය දුර දක්නා නුවණින් දුටුවේ ය. ඒ නිසා එතුමා නිදහස් අරගලයට අවශ්‍ය පුද්ගලයෙකුගේ හැදියාව ප්‍රබල කොට සලකන ලදි. සදාචාරාත්මක දැනුමෙන් යුතු වීමෙන් පුද්ගලයා ස්වාධීන වීමට උවමනා පසුබිම සකසන බව එතුමා දැන සිටියේ ය. රට පුරා සංචාරය කරමින්, බටහිර ආර්ථික ශක්තියෙන් යුතු සදාචාර සම්පන්න පුද්ගලයින් බිහි කරමින්, ඔවුන්ව නිදහස් අරගලය කරා මෙහෙයවීම එතුමාගේ අධිෂ්ඨානය විය. බුදු දහමේ පෝෂණය ඊට හේතුව වන බව එතුමා දැන සිටියේ ය. එතුමාගේ වදනින් ම කියතොත්,

"සිංහලයා දවසින් දවස පහළ යන්නේ බීමත්කම නිසයි. මත් බීම, අනුන්ට බොන්නට දිම, සෑදීම, විකිණීම බුදුරජාණන් වහන්සේ ද එපා කියා තිබේ"

"රා බොන්නා උගුඩුවෙකි, වසලෙකි" යනුවෙන් ඔහු පවසා ඇත. "උප ජාතිය නැති වීමට මත්පැන් හේතු වී තිබේ."

"සිංහලයාට විෂ මත්පැන් බොන්නට දී සිහලුන් නැති කළ සුද්දා අපේ පරම්පරා සතුරන් සේ මා සළකමි."

"සුදු මිනිසා මත්පැන් බොයි, බී ඇඳ වැටෙයි. ස්වදේශිකයා මත්පැන් නොබොයි. පිරිමැස්මෙන් නැගෙයි. කල් නොයවා අපට එක් දෙයක් දැකිය හැකි වන්නේ ය. පහත් සුදු මිනිසා ස්වදේශිකයාට සේවය කරයි. එය වෙනස් කිරීමට නම් ස්වදේශිකයාට මත්පැන් දෙනු. ඔහුගේ අවශ්‍යතා වැඩි කරනු. කල් නොයවා ඔහු ම්ලේච්ඡ භාවයට පත් වනු ඇත" යි බටහිර ලේඛකයෙකු පවසා ඇත. ඉංග්‍රීසීන් මෙය අපේ රටේ නිසි ලෙස ක්‍රියාත්මක කළේ ය.

මුලින් අරක්කු නොමිළේ ලබා දෙන ලදි. පුරුදු වූ මිනිසා ධනය ඉවර වන තෙක්ම බීමට ඇබ්බැහි වේ. මත් බීමේ උගුළ අද සමාජයේ කොතෙක් දුරට කිඳා බැස ඇත්දැයි අවබෝධයෙන් බැලිය යුතු ය.

කිසිම ප්‍රනීත රසයක් නැති, ප්‍රසන්න සුවඳක් නැති, ආහාරයක් නොවන, පෝෂණයක් නැති අප්‍රසන්න බීමක්, රසවත් වටිනා අග්‍රගණ්‍ය දෙයක් ලෙස අලෙවි කරන වෙළඳ උපායන්ට අප අසු වී ඇති ආකාරය කෙසේ ද? මගුළට, මළගෙදරට, සතුටට දුකට තෑගි දෙන්නට, තෑගි ලබන්නට නැතිවම බැරි දෙයක් සේ සිංහල බෞද්ධයා ඔලමොට්ටලයෙකු කරමින් මුදලුත් සෞඛ්‍යත් සැබෑ සතුටත් විනාශ කරවන තැනට මත්පැන් පත්ව සිටී.

අනගාරික ධර්මපාලතුමන් ඇතුලු අමද්‍යප නායකයින් අදින් වසර 100 කට එපිට අමද්‍යප ව්‍යාපාරය සැබෑ ලෙසම අද සිංහල බෞද්ධ ජනතාවට එදාටත් වඩා අත්‍යවශ්‍ය ය. අපේ රටෙන් පරම්පරාවට උරුම වූ සභ්‍යත්ව විඥානය නූතන පරපුරට ගලා එන්නේ නැත.